ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1) 244-9070
විද්‍යුත් තැපැල: VanHornNT@state.gov http://lk.usembassy.gov

නිවේදන අංක: 08302018

## 'යුඑස්එස් ඇන්කොරේජ්' නෞකාව, ශ්‍රී ලංකා නාවික හමුදාව සමග අභ්‍යාසවල යෙදේ

**ඉන්දියානු සාගරය, අගොස්තු 30:** 'යුඑස්එස් ඇන්කොරේජ්' නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදාවේ සුරනිමල නෞකාව සමග එක්ව අගෝස්තු **28** වනදා සාගර අභ්‍යාසයක යෙදුණේය. මෙම අභ්‍යාසය නිසා නැව් දෙකේ කාර්ය මණ්ඩලවලට දැනුම වැඩි කර ගැනීමට මෙන්ම නිදහස් හා විවෘත ඉන්දු-පැසිෆික් කාලාපයේ මෙහෙයුම්වලදී වැදගත්වන විවිධ නාවික ශාස්ත්‍ර කුසලතා ලබා ගැනීමටද හැකි වූයේය.

මෙම අභ්‍යාසය තුළ සන්නිවේදන හා යුද්ධාභ්‍යාස ක්‍රියා මාර්ගවල නිරතවීම සඳහා නෞකා ගණනාවක් නියමිත රටාවකට යාත්‍රා කළේය. 'ඇන්කොරේජ්' හා 'සුරනිමල' යන නෞකා දෙකට අමතරව LCAC යානා දෙකක්, AH-IZ කෝබ්‍රා හෙලිකොප්ටරයක් හා UH-IY හුවේ හෙලිකොප්ටරයක්ද මෙම අභ්‍යාසයට සහභාගී විය.

"මෙම සංචාරයේදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ අපේ හවුල්කරුවන් සමග කටයුතු කිරීමට ලැබීම ඇන්කොරේජ් නෞකාවේ නැවියන් හා භටයන් ගෞරවයක් ලෙස සලකයි" යනුවෙන් ප්‍රකාශ කළේ එක්සත් ජනපද 7වැනි නාවික බලඇණියේ දිය ගොඩ දෙකේම යෙදවිය හැකි සේනාංකයේ අණදෙන නිලධාරී රියර් අද්මිරාල් බ්‍රැඩ් කූපර්ය. "අප මෙම සංචාරයේ දී දුටු සමීප කණ්ඩායම් වැඩ, පසුගිය වසරේ බහුවිධ හමුදා අභ්‍යාසවල එක්සත් ජනපද-ශ්‍රී ලංකා සහභාගීත්වය හා අප්‍රේල් මාසයේ 'යුඑස්එන්එස් මර්සි' නම් රෝහල් නෞකාව ත්‍රිකුණාමලයට පැමිණීම ආදියෙන් පිළිබිඹු වන්නේ එක්සත් ජනපද හා ශ්‍රී ලංකා හමුදාවන් අතර සබඳතා ශක්තිමත් කිරීමට අප දක්වන අන්‍යෝන්‍ය කැපවීමයි."

ශ්‍රී ලාංකික නැවියන් සමග එකට යාත්‍රා කිරීමෙන් ඇන්කොරේජ් නැවියන්ට ඔවුන්ගේ කුසලතා දියුණු කර ගැනීමට අවස්ථාවක් ලැබුණි. වර්ධනය වන එක්සත් ජනපද- ශ්‍රී ලංකා නාවික සහයෝගිතාවේ කොටසක් වන මෙම මුහුදු අභ්‍යාසයට පෙර, ශ්‍රී ලංකා නාවික හමුදාව සමග පැවැත්වූ ආරක්ෂා සහයෝගිතා අභ්‍යාස, අගෝස්තු 2 වනදා අවසන් වූ පැසිෆික් වළල්ලේ (RIMPAC) අභ්‍යාසවලට ශ්‍රී ලංකා නාවික හමුදාව මුල් වරට සහභාගීවීම මෙන්ම පසුගිය අවුරුද්දේ පළමුවරට ශ්‍රී ලංකාවේ පැවැත්වූ මුහුදේ සහයෝගිතා සූදානම හා පුහුණුව (CARAT) වැඩසටහනද වේ.

"ඇන්කොරේජ් කණ්ඩායමට හා මට ත්‍රිකුණාමලේදී පුදුම සහගත අත්දැකීමක් ලැබුණු අතර ශ්‍රී ලංකා නාවික හමුදාව සමග එක්ව සේවය කිරීමට ලැබීම ගැන අපි ආඩම්බර වෙමු"යි 'යුඑස්එස් ඇන්කොරේජ්' නෞකාවේ අණදෙන නිලධාරී කපිතාන් ඩෙනිස් ජැකෝ ප්‍රකාශ කළේය. "එයින් අපේ සන්නිවේදන නිපුණතාව වැඩි වූවා පමණක් නොව ශ්‍රී ලංකා නාවික හමුදාව සමග ශක්තිමත් හා කල් පවතින සහයෝගීතාවක් ගොඩ නගා ගැනීමටද හැකි වූයේය"යි ඔහු වැඩිදුරටත් කියා සිටියේය.